# මූලික ප්‍රතිපත්ති

## අප විශ්වාස කරන දේ

අපි ස්ත්‍රී පුරුෂ භාවය සහ සමාජ සාධාරණත්වය සඳහා පිරිමින් සහ පිරිමි ළමයින් සමඟ වැඩ කිරීමෙන් සහ පුරුෂාධිපත්‍යය පිළිබඳ හානිකර හා දැඩි ව මුල් බැසගත් සංකල්පවලට අභියෝග කරමින් පීතෘමූලික බලය තුරන් කිරීමේ හවුල් මෙහෙවරක් ඇති ජාත්‍යන්තර ප්‍රජාවකි. අප අතර පවතින විවිධත්වයන් අපි සමරන්නෙමු. අපගේ පසුබිම්, යථාර්ථයන්, ක්‍රමවේද සහ සන්දර්භ විවිධ වේ. නමුත් අපි තුළ දැනට අපි දකින ලෝකය සහ අපිට දකින්න අවශ්‍ය වන ලෝකය පිළිබඳ පොදු අවබෝධයක් ඇත්තෙමු.

අපගේ *මූලික ප්‍රතිපත්ති* මෙම පොදු අවබෝධයේ පදනම වේ. පුද්ගලයන්, සංවිධාන, සහ සාමූහිකයක් ලෙස, මෙම මූලධර්ම අපගේ විශ්වාසයන් සහ වටිනාකම් තහවුරු කරයි, අපගේ උත්සාහයන් මඟ පෙන්වයි, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ සාධාරණත්වය සහ සැමට මානව හිමිකම් සඳහා වන අපගේ වැඩකටයුතුවලට අනුබල දෙයි. ඒ, සියලු මිනිසුන් සමාන වන සහ වෙනස් කොට සැලකීම් සහ පීඩනයෙන් තොර ලෝකයක් සඳහා යි.

මෙම මූලික මූලධර්ම MenEngage Alliance වගවීමේ ප්‍රමිතීන් සහ චර්යාධර්ම සංග්‍රහය සමඟ ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ.

**මූලික ප්‍රතිපත්ති**

### 1. අපි කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින්නෙමු

ලොව පුරා කාන්තාවන් සහ ගැහැනු ළමයින් සැලකිය යුතු මට්ටමක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසාධාරණකම්වලට සහ මානව හිමිකම් කඩවීම්වලට මුහුණ දෙන බව **අපි හඳුනා ගනිමු.** මෙය වහා වෙනස් විය යුතු ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ සහ අසාධාරණයේ මුල් බිඳ දැමීම හරහා අපි මෙම වෙනස සඳහා ක්‍රියා කරන්නෙමු.

ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරවල ඓතිහාසික අරගලවලට සහ ජයග්‍රහණවලට **අපි ගරු කරන්නෙමු.**

ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන, ජාල සහ ව්‍යාපාර සමඟ මිත්‍රත්වයෙන් වැඩ කිරීමට **අපි කැප වෙන්නෙමු.** අපි ස්ත්‍රීවාදී නායකත්වයට, හඬට සහ අවකාශයන්ට ගරු කරන්නෙමු. අපි ස්ත්‍රීවාදී ඉල්ලීම් සහ දේශපාලන න්‍යායපත්‍රවලට සහාය දෙන්නෙමු.

අසමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බල සම්බන්ධතා පරිවර්තනය කිරීමට **අපි උත්සාහ කරන්නෙමු.** සීමාකාරී ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ගෙන් සහ ලිංගික සම්මතයන්ගේ බලපෑමෙන් විවිධ ලිංග අනන්‍යතා ඇති කාන්තාවන්, පිරිමින් සහ පුද්ගලයන් නිදහස් කරගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

### 2. අපි අන්තර්ඡේදනීය (intersectional) ස්ත්‍රීවාදය විශ්වාස කරන්නෙමු

සමලිංගික භීතිකාව, සංක්‍රාන්ති භීතිකාව, වර්ගවාදය, වයස් භේදය, අනාබාධිතබව, පන්තිවාදය, හෝ ඇදහිලි මත පදනම් වූ සහ/හෝ ආගමික විශ්වාසයන් හෝ පසුබිම් මත පදනම් වූ වෙනත් අසාධාරණයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න **තේරුම් ගැනීමට අපි උත්සාහ කරමු.** පීඩාව නිසා මිනිසුන්ට විවිධ බලපෑම් එල්ල වන බවත්, සමහර

පුද්ගලයන්ට එකවර නොයෙකුත් ආකාරවලින් බලපෑම් එල්ල වන බවත් අපි හඳුනා ගනිමු. මෙම පීඩනයේ ස්ථර සහ අන්තර්ඡේදනීය ගැටලු කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට, එක් ස්ත්‍රී පුරුෂ සමාජ භාවයකට අයත් නොවන පුද්ගලයින්ට, කළු සමක් ඇති පුද්ගලයින්ට, ආබාධිත පුද්ගලයින්ට සහ වාර්ගික සුළුතරයන්ට අසමාන ලෙස බලපායි.

විවිධ ආකාරයේ පීඩාවන්, වෙනස් කොට සැලකීම් සහ අසාධාරණයන් මගින් අසමානුපාතික ලෙස කොන් කරන ලද අයගෙ මඟ පෙන්වීම් **අපි අපේක්ෂා කරන්නෙමු.**

අන්තර් ඡේදනීය ස්ත්‍රීවාදී ඉලක්ක සඳහා සහය වන ආකාරය සහ සමාජ සාධාරණත්වය සඳහා වගකිවයුතු ක්‍රියාමාර්ග ගත හැකි ආකාරය ගවේෂණය කිරීමට පිරිමින් සහ පිරිමි ළමුන් පෙලඹවීමට **අපි ක්‍රියා කරන්නෙමු.**

පිරිමින්ගේ සහ පිරිමි ළමයින් තුළ පවතින විවිධත්වය අපි හඳුනාගෙන ඇති අතර ඔවුන් සියල්ලන් ම බලය සහ වරප්‍රසාද එක ආකාරකට අත්විඳින්නේ නැති බව **අපි දන්නෙමු.**

## 3. අපි සැමට මානව හිමිකම් හිමි කරදීම සඳහා සහාය දෙන්නෙමු

අපි මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ (UDHR), කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW), ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (CRC) සහ අනෙකුත් ජාත්‍යන්තර මානව හිමිකම් මෙවලම්වල මූලධර්මවලට **අනුකූල ව කටයුතු කරන්නෙමු.**

මානව හිමිකම් පිළිගෙන, ඒවා තහවුරු කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට රජයන් විසින් බැදෙන බවට වගවීමට හා ඒ වෙනුවෙන් උද්දේශනය කිරීමට **අපි බැඳී සිටිමු.**

## 4. පුරුෂමූලිකත්වය විනාශ කර අවසන් කිරීමට අපි කටයුතු කරන්නෙමු

පුරුෂාධිපත්‍යය යනු සෑම සමාජයක ම සිටින සෑම කෙනෙකුට ම බලපාන පීඩාකාරී ක්‍රමයක් බව අපි හඳුනා ගනිමු. පුරුෂාධිපත්‍යය යනු ස්ත්‍රීත්වයට වඩා පුරුෂත්වය අගයන, සහ කාන්තාවන්, ගැහැනු ළමයින් සහ එක් ස්ත්‍රී පුරුෂ සමාජභාවයකට අයත් නොවන පුද්ගලයින්ට වඩා පිරිමින්ට සහ පිරිමි ළමයින්ට සාමූහික ව බලය ලබා දෙන පද්ධතියක් ලෙස **අපි තේරුම් ගන්නෙමු.**

මිනිසුන් සහ පෘථිවිය සූරාකෑමේ පුරුෂමූලික හැසිරීම් රටාවන් අවසන් කිරීමට අපි කටයුතු කරමු. අපි නිස්සාරණ ආර්ථික ආකෘතිවලට විරුද්ධ වන අතර පුද්ගලයින්ගේ ශරීරය, ඉඩම් සහ ජීවනෝපාය පිළිබඳ ව එයට තිබෙන පාලනය අවසන් කිරීමට **කටයුතු කරන්නෙමු.** ඔවුන්ට අනුබල දෙන වරප්‍රසාද සහ බලය පිළිබඳ දේශපාලනික ක්‍රම පරිවර්තනයක් කිරීමට අපි උත්සාහ කරමු.

සියලු මිනිසුන්ගේ සහ ග්‍රහලෝකය අතර පවතින සහයෝගීතාවයේ සහ අන්තර් සම්බන්ධතාවේ විශ්වීය බැඳීම පිළිබඳ ව **අපි විශ්වාස කරමු.** ලොව පවතින ජෛව විවිධත්වය තුළ සියලු ම මිනිසුන්ට සහ පෘථිවියට තිරසාරත්වය, රැකවරණය සහ යහපැවැත්ම මත පදනම් වූ අනාගතයක් කරා යන සාමූහික ව්‍යාපාරවල කොටසක් ලෙස අපි අප ව දකින්නෙමු.

## 5. විවිධ අනන්‍යතා, ප්‍රකාශන සහ ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වයේ ලක්ෂණ අපි සමරමු; ඒවා පිළිගනිමු.

සියලු විවිධත්වය තුළ සමලිංගික, සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික සහ ක්වියර් පුද්ගලයන්ගේ මානව හිමිකම් සඳහා **අපි තරයේ සහාය දක්වමු.**

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන් සංකීර්ණ, නම්‍යශීලී, විවිධාකාර සහ වෙනස්වන සුළු දෙයක් ලෙස **අපි හඳුනා ගන්නෙමු.**

විවිධ ලිංගික දිශානති, ස්ත්‍රී පුරුෂ භාවය, ප්‍රකාශන සහ ලිංගික ලක්ෂණ මත සිස්-ලිංගභේදය (උපතේදී ලද ලිංගිකත්වය සමග එකඟ වන) සහ විෂමලිංගික අනන්‍යතාවයන්ට වරප්‍රසාද ලබා දෙන හානිකර සමාජ සම්මතයන් පරිවර්තනය කිරීමට **අපි ක්‍රියා කරන්නෙමු.**

අපි සමලිංගික භීතිකාවට හා විෂමතාවයට එරෙහි ව හඬ නැගීමට පිරිමින් හා පිරිමි ළමයින් සහ සියලු ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ට අයිති පුද්ගලයින් **සමග වැඩ කරන්නෙමු.**

## 6. ජාතිවාදය සහ එයට මුල් වූ හේතුන් විසඳීමට අපි උත්සාහ කරන්නෙමු.

සුදු ආධිපත්‍යය, යටත් විජිතවාදය සහ වර්ගවාදයේ ඉතිහාසය සහ පද්ධති තුළ පවතින බවත්, ඒවායේ කොටසක් බවත් **අපි පිළිගනිමු.** අපි ලෝකයේ ඕනෑ ම තැනක පවතින යටත් විජිතවාදී, ජාතිවාදී සහ වාර්ගික පීඩනයට එරෙහි ව නැගී සිටින්නෙමු.

ගෝලීය වශයෙන් කළු ජාතිකත්වයට සහ ආදිවාසීන්ට එරෙහි සියලු ආකාරවලින් ජාතිවාදයට අභියෝග කිරීමේ හදිසි අවශ්‍යතාව **අපි හඳුනා ගනිමු.**

වාර්ගික යුක්තිය සඳහා අඛණ්ඩ සාමූහික පරාවර්තනය, අධ්‍යාපනය සහ ක්‍රියාමාර්ග සඳහා **අපි ඉඩ සලසන්නෙමු.**

හුදෙක් ජාතිවාදී නොවී සිටීම ඉක්මවා, සක්‍රිය ව ජාතිවාදයට විරෝධී වීම දක්වා **අපි ගමන් කරන්නෙමු.**

## 7. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජීය සහ දේශගුණික යුක්තිය සඳහා ක්‍රියාකාරී ව සහාය දැක්වීමට පිරිමින්ට සහ පිරිමි ළමයින්ට ඇති හැකියාව පිළිබඳ අපි විශ්වාස කරන්නෙමු

අපි තුළ ඇති මනුෂ්‍යත්වය කෙරෙහි **අපි විශ්වාසය තබන්නෙමු.**

සියලු ම පිරිමින්ට සහ පිරිමි ළමයින්ට, ඔවුන්ගේ සියලු විවිධත්වයන් තුළ, පුරුෂාධිපත්‍ය බලය ගැන වූ සීමාකාරී සහ හානිකර නිර්වචන විවේචනාත්මක ව තේරුම් ගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට සහ ජය ගැනීමට හැකි බව **අපි විශ්වාස කරන්නෙමු.** පිරිමින්ට සහ පිරිමි ළමයින්ට සංවේදනය, සැලකිල්ල සහ සාමය සඳහා ඔවුන්ගේ හැකියාවන් සම්පූර්ණයෙන්ම වර්ධනය කර ගත හැකි වන පරිදි පුරුෂමූලික බාධක ජය ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

පිරිමින් සහ පිරිමි ළමයින් පුද්ගල අයිතිවාසිකම්, යුක්තිය, සෞඛ්‍යය, කාන්තාවන්, ගැහැනු ළමයින් සහ සියලු ම ස්ත්‍රී පුරුෂසමාජභාවයන්ට අයත් පුද්ගලයින්ගේ යහපැවැත්ම සඳහා ක්‍රියා කළ යුතු යැයි **අපි විශ්වාස කරන්නෙමු.**

පිරිමින් සහ පිරිමි ළමයින් පුරුෂාධිපත්‍යය නිසා වරප්‍රසාද ලබන බව මෙන් ම හානියට ලක් වන බව **අපට වැටහේ.** පිරිමින් සහ පිරිමි ළමුන් ඇතුළු සියලු දෙනා ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය යුක්තිය සහිත ලෝකයකින් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

## 8. අපි අපගේ පද්ධති, භාවිතයන්, වටිනාකම් සහ මානසිකත්වයන් යටත් විජිතහරණය කිරීමට උත්සාහ කරන්නෙමු

යටත් විජිත, යුරෝ කේන්ද්‍රීය සහ ප්‍රමුඛ ගෝලීය-උතුරු බල ව්‍යුහයන් විසින් ලොව පුරා අසමානතා ඇති කරන්නේ කෙසේ දැ යි **අපි ප්‍රශ්න කරන්නෙමු**, තේරුම්ගන්න උත්සාහ කරන්නෙමු; ඒවාට අභියෝග කරන්නෙමු. මෙම අතිශය අසමාන ගෝලීය බල ව්‍යුහයන් සහ ඒවාට අනුබල දෙන පුරුෂාධිපත්‍යය පිළිබඳ පුරුෂමූලික සංකල්ප පරිවර්තනය කිරීමට අපි කටයුතු කරන්නෙමු.

පීඩිත සහ ස්වදේශික සංස්කෘතීන්වලට හා එවන් හඬ සහිත නායකත්වයට සහ ප්‍රඥාවට **අපි ගරු කරන්නෙමු.**

යටත් විජිතවාදය ලොව පුරා ස්ත්‍රී පුරුෂ අසමානතාවයන් සහ වෙනත් ආකාරයේ පීඩාවන් සහ වෙනස් කොට සැලකීම් කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කරන ආකාරය **අපි හඳුනා ගන්නෙමු.**

ජාතීන් සහ ප්‍රජාවන් අතර බලය සමාන ව බෙදී යන අන්තර්කරණ ව්‍යුහයන් නිර්මාණය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට **අපි උත්සාහ කරන්නෙමු.** යටත් විජිතවාදයේ උරුමය මත පදනම් වූ පීඩාකාරී සහ වෙනස් කොට සැලකීමේ ව්‍යුහයන් තුළ අපගේ කාර්යය - එහි අරමුදල් ඇතුළු ව - ස්ථාපිත වී ඇති ආකාරය සහ අපගේ වචන සහ ක්‍රියාවන් එහි හානිකර ගතිකත්වය ප්‍රතිනිෂ්පාදනය කිරීමේ අවදානමක් ඇති ආකාරය දෙස අපි විවේචනාත්මක ව විමසා බලන්නෙමු.

## 9. පරිවර්තනය අප තුළින් ම ආරම්භ විය යුතු බව අපි විශ්වාස කරන්නෙමු

අප ද පීඩාකාරී පද්ධති තුළ සහ එහි කොටසක් ලෙස ජීවත් වන බවත්, ඒවා පරිවර්තනය කිරීම යනු අපව පරිවර්තනය කිරීම බවත් **අපි පිළිගන්නෙමු.** පුද්ගල පරිවර්තනය සමාජ වෙනසක් සමඟ අත්‍යන්තයෙන් බැඳී ඇත.

තමන්, අන් අය සහ සංකීර්ණ සමාජ ගැටලු පැන නගින පද්ධති පිළිබඳ පරිවර්තනීය දැනුවත්භාවය සඳහා පිරිමින් සහ පිරිමි ළමයින් අතර අඛණ්ඩ පරාවර්තක භාවිතයන් **අපි ප්‍රවර්ධනය කරන්නෙමු.**

පුරුෂාධිපත්‍යය, වර්ගවාදය, යටත්විජිතවාදය, ධනවාදය, ආගමික මූලධර්මවාදය සහ ඒවායේ අන්තර් සම්බන්ධිත පීඩාකාරී පද්ධති විසින් සිදු කරන හානිය පිළිබඳ ව **දැනුවත්ව සිටීමට අපි උත්සාහ කරන්නෙමු.** පුද්ගලික සහ සාමූහික සුවය; ස්වයං සහ සාමූහික රැකවරණය සඳහා අපි ඉඩ ලබා දෙන්නෙමු.

අපේ මුළු ආත්මය ම - අපගේ ශරීරය, අපගේ හැඟීම්, අපගේ මනස සහ අපගේ වටිනාකම් - පුරුෂාධිපත්‍යය තුරන් කිරීමේ කාර්යයට **අපි ගෙන එන්නෙමු.**

## 10. අපගේ ප්‍රකාශ, ක්‍රියාවන් සහ තීරණ පිළිබඳ අපි වගකියන්නෙමු

විවේචන සහ ප්‍රතිපෝෂණ සාදරයෙන් **අපි පිළිගන්නෙමු.** එය පිළිගැනීමටත්, ඒවායින් ඉගෙනීමටත්, වර්ධනය වීමටත්, වගකිවයුතු ආකාරවලින් ප්‍රතිචාර දැක්වීමටත් කැප වෙන්නෙමු.

ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන, LGBTQI+ අයිතිවාසිකම් කණ්ඩායම් සහ වාර්ගික යුක්තිය, තරුණ, ආර්ථික සහ දේශගුණික යුක්තිය, සාමය, ආගමික නිදහස සහ තවත් බොහෝ දේ සඳහා විවිධ ව්‍යාපාරවලට සවන් දීමට, උපදේශනයට සහ හවුල් වීමට **අපි බැඳී සිටින්නෙමු.** අප වැඩ කරන සන්දර්භයන් තුළ මෙම ස්ත්‍රීවාදී හවුල්කරුවන්ට අප වගකිව යුතු ය.

අපගේ වැඩ, ක්‍රියාකාරීත්වය, හැසිරීම්, ආකල්ප සහ භාවිතයන් මගින් බලපෑමට ලක්වන ප්‍රජාවන්ට, සංවිධානවලට, හවුල්කරුවන්ට සහ කණ්ඩායම්වලට වගවීමට **අපි උත්සාහ කරන්නෙමු.** මෙයට අප එකිනෙකාට වගවීම සහ MenEngage Alliance ජාල සමූහයේ අපගේ නායකත්වය ද ඇතුළත් වේ.

ප්‍රජාතන්ත්‍රවාදී, පාරදෘශ්‍යභාවයෙන් යුතු හා බලය බෙදාගැනීමේ ප්‍රවේශයන් **අපි ප්‍රවර්ධනය කරන්නෙමු.** හවුල් බලය, සමානාත්මතාවය සහ යුක්තිය ඇති ලෝකයක් බිහිකිරීමට නම් වගවීම අත්‍යවශ්‍ය වන බව අපි විශ්වාස කරන්නෙමු.